# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

**අති විශෙෂ**

**අංක 2085/45 - 2018 අගෝස්තු මස 24 වැනි සිකුරාදා - 2018.08.24**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


## I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

### රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/1978 (XVI)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය සමග කියවිය යුතු ඒ පනතේ 18 වන වගන්තිය යටතේ සාදන ලද නියමාවලිය.

ලේකම්,
විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2018 අගෝස්තු මස 23 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මෙම නියමාවලිය 2018 අංක 03 දරන කළමනාකරණ පශ්චාත් උපාධි ආයතන නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලබන අතර එය, 2018.08.23 වැනි දින සිට ක්‍රියාත්මක වන්නේය.

2. 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 24අ වගන්තිය යටතේ අමාත්‍යවරයා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විමසා සාදන ලද 1985 දෙසැම්බර් මස 24 වැනි දින අංක 381/5 දරන අතිවිශෙෂ ගැසට් පත්‍රයේ පළ කරන ලද 1985 දෙසැම්බර් මස 18 වැනි දිනැති නියමය මගින්, 1986 ජනවාරි මස පළමු වැනි දින පිහිටුවනු ලැබූ (මෙහි මින් මතු "ආයතනය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ පශ්චාත් උපාධි ආයතනයට මෙම නියමාවලිය අදාළ විය යුතු ය.

3. (මෙහි මින් මතු "විශ්වවිද්‍යාලය" යනුවෙන් සඳහන් කරනු ලබන) ශ්‍රී ලංකාවේ ශ්‍රී ජයවර්ධනපුර විශ්වවිද්‍යාලයට මෙම ආයතනය අනුයුක්ත කරනු ලැබිය යුතු ය.


1A - PG 004184 - 107 (2018/08)
මෙම අතිවිශෙෂ ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.

4. පනතෙහි සහ යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට සහ (මෙහි මින් මතු "කොමිෂන් සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාලය ප්‍රතිපාදන කොමිෂන් සභාවේ බලතල, කාර්ය සහ කර්තව්‍යයන්ට යටත් ව ආයතනයට-

(අ) ශිෂ්‍යයන් ඇතුල් කර ගැනීම;

(ආ) ආයතනයේ නිර්දේශය මත කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන්නා වූ ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි කළමනාකරණය, අලෙවිකරණය, මූල්‍ය සහ පරිපාලනය පිළිබඳ විවිධ ක්ෂේත්‍රයන්හි පශ්චාත් උපාධි තත්ත්වයේ ඉගැන්වීම්, වැඩසටහන්, සම්මන්ත්‍රණ, පුහුණු කිරීම්, පර්යේෂණ සහ සංවර්ධන අධ්‍යයන සඳහා කටයුතු සැලැස්වීම;

(ඇ) විශ්වවිද්‍යාලයේ අනුමතය සහ කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව කළමනාකරණය, අලෙවිකරණය, මූල්‍ය සහ පරිපාලනය පිළිබඳ අධ්‍යයනවල විවිධ ක්ෂේත්‍රයන් හි ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා නිශ්චය කිරීම;

(ඈ) කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ විවිධ ක්ෂේත්‍රවල ප්‍රවීණත්වය ලැබූ තැනැත්තන් නිශ්චය කිරීමේ කාර්ය සඳහා විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාවේ සහ විදේශයන්හි පශ්චාත් උපාධි පරීක්ෂණ පැවැත්වීම සහ එම විභාගවලින් සාමාර්ථය ලබා, විශ්වවිද්‍යාලය විසින් ආයතනය විමසීමෙන් පසු සාදනු ලැබිය හැකි අතුරු ව්‍යවස්ථා මගින් නියම කරන ලද වෙනත් කොන්දේසි සහ අවශ්‍යතා සපුරාලීමෙන් පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ විශ්වවිද්‍යාලයේ වෙනත් ශාස්ත්‍රීය විශිෂ්ටතා ප්‍රදානය කිරීමට සුදුසුකම් ලැබූ තැනැත්තන් විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම සහ විශ්වවිද්‍යාලයේ අනුග්‍රහය යටතේ තත්කාර්ය සඳහා උපාධි ප්‍රදානෝත්සව සංවිධානය කර පැවැත්වීම;

(ඉ) අතුරු ව්‍යවස්ථාවකින් නියම කරනු ලැබිය හැකි පරිදි ආයතනයට ඇතුල්වීමට අපේක්ෂා කරන තැනැත්තන් හෝ ආයතනයේ ශිෂ්‍යයන් හෝ විශ්වවිද්‍යාලවල දී හෝ විශ්වවිද්‍යාල මට්ටමේ අධ්‍යයන ආයතනවල දී සාමාර්ථය ලත් විභාග හා ගත කළ අධ්‍යයන කාලසීමාව, ආයතනයේ එවැනි විභාගවලට හා එවැනි අධ්‍යයන කාල සීමාවලට හෝ ඉන් යම් කොටසකට සමාන ලෙස සලකනු ලැබීම හා ඕනෑම අවස්ථාවක එසේ සලකනු ලැබීම ඉවත් කර ගැනීම, සනාතන සභාව විසින් පිළිගනු ලැබීමේ කාර්ය සඳහා නිර්දේශ කිරීම;

(ඊ) පර්යේෂණ හා අධ්‍යයන පාඨමාලා හෝ පාඨමාලාවල කොටස් විශ්වවිද්‍යාලයෙන් සහ ආයතනයෙන් බාහිර වූ ස්ථානවල පැවැත්වීමට කටයුතු සැලැස්වීම සඳහා විධිවිධාන සලස්වන යම් අතුරු ව්‍යවස්ථාවක් අනුව එසේ කටයුතු සැලැස්වීම;

(උ) කළමනාකරණය සහ පරිපාලනය පිළිබඳ අධ්‍යයන ක්ෂේත්‍රවල අධ්‍යයන පාඨමාලා පැවැත්වීම, පුහුණු කිරීම, පර්යේෂණ පැවැත්වීම සහ ප්‍රකාශන පළකිරීම සඳහා හෝ ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා හෝ අවශ්‍ය විය හැකි මිනිස් ශ්‍රම, ද්‍රව්‍ය සහ වෙනත් ආකාරවල සම්පත් ආයතනයේ පරමාර්ථවලට සමාන හෝ සාරානුකූලව සමාන පරමාර්ථ ඇති ශ්‍රී ලංකාවේ හෝ පිටරට වෙනත් විශ්වවිද්‍යාල හෝ ආයතන හෝ සමග හුවමාරු කර ගැනීම, ඒවායින් ලබා ගැනීම හෝ ඒවා සමග සහයෝගයෙන් ක්‍රියා කිරීම;

(ඌ) ආයතනයේ ඉගැන්වීමේ, පුහුණු කිරීමේ සහ පර්යේෂණ හැකියාවන් වැඩි දියුණු කිරීමේ කාර්ය සඳහා ශ්‍රී ලංකාවේ හෝ විදේශයන්හි රජයේ හෝ පෞද්ගලික අංශයේ ආයතන හෝ සංවිධාන සමග අවස්ථාවන්, සම්පත් හෝ අන්‍යාකාරයේ සැපයීම් මගින් සහයෝගයෙන් කටයුතු කිරීම;

(එ) ආයතනයේ කාර්ය සඳහා පුස්තකාල, රසායනාගාර, තොරතුරු තාක්ෂණ මධ්‍යස්ථාන, පර්යේෂණ මධ්‍යස්ථාන සහ කියවීම් ශාලා, විනෝද කටයුතු මධ්‍යස්ථාන, කාර්ය මණ්ඩල සහ ශිෂ්‍ය ආපනශාලා සහ අනෙකුත් සුභසාධන පහසුකම් සහ ගොඩනැගිලි ඉදිකිරීම, ඒවාට උපකරණ ලබා දීම සහ ඒවා පවත්වා ගෙන යාම;

(ඒ) විදේශීය විද්වතුන්, වෘත්තිකයන් ඇතුළුව ගුරුවරුන්, පරීක්ෂකයන්, උපදේශකයන් සහ පර්යේෂණ අධීක්ෂකවරු ලෙස ආයතනය විසින් අනුමත කළ හැකි යම් තැනැත්තන් විශ්වවිද්‍යාලයේ අනුමතය ඇතිව පත් කිරීමට සහ විශ්වවිද්‍යාලයේ අනුමැතිය ඇතිව ඒ තැනැත්තන්ගේ සේවා කාලය සහ සේවා කොන්දේසි සහ ඔවුන්ගේ වැටුප්, දීමනා, වේතන හෝ වෙනත් අර්ථලාභයන් නිශ්චය කිරීම;

(ඔ) ශාස්ත්‍රීය සහ වෘත්තීමය වටිනාකමක් සහ ප්‍රයෝජනයක් ඇති විද්වත් සඟරා, පොත්, පුවත්පත්, සහ වෙනත් ප්‍රකාශන මුද්‍රණය කර පළකිරීම සහ එවැනි දේවලට දායකවීමට ලේඛකයන්ට අනුග්‍රාහකත්වය සැපයීම;

(ඕ) ශාස්ත්‍රීය සහ වෘත්තීමය ප්‍රගමනය සහ ඇගයීමේ කාර්යය සඳහා සහ ආයතනයේ සුභසාධනය වෙනුවෙන් සම්මන්ත්‍රණ, සම්මේලන, නේවාසික වැඩමුළු සංවිධානය කර පැවැත්වීම;

(ක) ආයතනයේ කාර්ය මණ්ඩලයේ අධ්‍යයන, පරිපාලන සහ වෙනත් යන අංශ දෙකේම වෘත්තීය සංවර්ධනය සඳහා විධිවිධාන සැලැස්වීම සහ කාර්ය මණ්ඩල සුභසාධන වැඩසටහන්වලට සහ සමාජ වගකීම් (CSR) වැඩසටහන්වලට සම්බන්ධවීම සහ

අනුග්‍රාහකත්වය දැක්වීම සහ ආයතනයේ ආදී ශිෂ්‍යයන්ගේ කටයුතු සහ සංවර්ධනය උදෙසා ආදී ශිෂ්‍යයන් විසින් පිහිටුවාගත් යම් සංවිධානයක කටයුතුවලට සහයෝගීව කටයුතු කිරීම, අනුග්‍රාහකත්වය දැක්වීම සහ ප්‍රවර්ධනය කිරීම;

(ග) ආයතනයේ පරමාර්ථ සාක්ෂාත් කර ගැනීම සඳහා ගාස්තු අය කිරීම, මුදල් ලබා ගැනීම සහ මුදල් වියපැහැදම් කිරීම සහ උපකරණ බෙදා හැරීම;

(ච) ආයතනයේ අරමුණු සාක්ෂාත් කර ගැනීම පිණිස අවශ්‍ය විය හැකි ඉහත සඳහන් බලතලවලට ආනුෂංගික වූ හෝ නොවූ වෙනත් සියලු ක්‍රියා හා දේ ඉටු කිරීම;

5. ආයතනයේ බල මණ්ඩල පහත දැක්වෙන බල මණ්ඩලවලින් සමන්විත විය යුතු යः-

(අ) කළමනාකාර මණ්ඩලය;

(ආ) අධ්‍යයන සභාව හෝ සභා; සහ

(ඇ) නියමාවලිය මගින් බල මණ්ඩලය වශයෙන් නියම කරනු ලැබිය හැකි වෙනත් මණ්ඩල;

6. (මෙහි මින් මතු "මණ්ඩලය" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණ මණ්ඩලය, ආයතනයේ අධ්‍යයන සහ විධායක මණ්ඩලය විය යුතු අතර එය, පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු යः-

(1) පහත දැක්වෙන නිලබලයෙන් පත් වන සාමාජිකයන්ගෙන්; එනම්ः-

(අ) (මෙහි මින් මතු "අධ්‍යක්ෂවරයා" යනුවෙන් සඳහන් කරනු ලබන) ආයතනයේ අධ්‍යක්ෂවරයා;

(ආ) විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා; සහ

(ඇ) විශ්වවිද්‍යාලයේ උපාධි අධ්‍යයන පීඨයේ පීඨාධිපතිවරයා;

(2) අධ්‍යාපන, වෘත්තීය, කාර්මික, කෘෂිකාර්මික, විද්‍යාත්මක, කළමනාකරණ, මූල්‍යමය, තාක්ෂණික, නීතිමය හෝ පරිපාලන විෂය ක්ෂේත්‍රය තුළ විශිෂ්ට සේවාවක් ඉටු කර ඇති තැනැත්තන් අතරින් (මෙහි මින්මතු "පත්කළ සාමාජිකයන්" යනුවෙන් සඳහන් කරනු ලබන) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන පහත දැක්වෙන සාමාජිකයන් අට දෙනා,

(i) උසස් අධ්‍යාපන විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු;

(ii) මුදල් විෂයභාර අමාත්‍යවරයාගේ අමාත්‍යාංශයේ ලේකම්වරයා විසින් නම් කරනු ලබන එක් සාමාජිකයෙකු;

(iii) (මෙහි මින් මතු "පාලක සභාව" යනුවෙන් සඳහන් කරනු ලබන) විශ්වවිද්‍යාල පාලක සභාව විසින් නම් කරනු ලබන සාමාජිකයන් දෙදෙනෙකු; සහ

(iv) කොමිෂන් සභාව විසින් පත්කරනු ලබන සාමාජිකයන් හතර දෙනෙකු;

7. (1) මණ්ඩලයේ සභාපතිවරයා, අධ්‍යක්ෂවරයා විය යුතු අතර, ඔහු මණ්ඩලයේ සියලුම රැස්වීම්වලට මූලාසනය දැරිය යුතු ය. මණ්ඩලයේ යම් රැස්වීමක මූලසුන දැරීමට සභාපතිවරයාට නොහැකි වුවහොත්, පැමිණ සිටින සාමාජිකයන් විසින් ඔවුන් අතරින් යම් සාමාජිකයෙකු ඒ රැස්වීමෙහි මූලසන දැරීමට තෝරා පත් කර ගත යුතු ය.

(2) පත් කරනු ලැබූ යම් සාමාජිකයෙක්, ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් මිස, ඔහු එසේ පත් කර ගනු ලැබූ දින සිට වර්ෂ තුනක කාලයක් ධූරය දරන අතර, ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, නැවත පත් කර ගනු ලැබීමට සුදුස්සෙක් වන්නේ ය.

එසේ වුවද, යම් පත් කරනු ලැබූ සාමාජිකයෙකු තම ධූර කාලය ඉකුත්වීමට පෙර ධූරය අත්හැර ගියහොත් ඔහුගේ අනුප්‍රාප්තිකයා, ඔහු කලින් ධූරය අත්හැර ගියහොත් මිස, තම පූර්වගාමියාගේ ධූර කාලයෙන් ඉකුත් නොවී ඉතිරිව ඇති කාලය තුළ ධූරය දරන්නේ ය.

(3) අධ්‍යක්ෂවරයා වෙත පිටපතක් යවමින් කොමිෂන් සභාවේ සභාපතිවරයා වෙත යවනු ලබන, තම අත්සන යටතේ වූ ලිපියක් මගින්, පත් කරනු ලැබූ යම් සාමාජිකයකුට, තම ධූරයෙන් ඉල්ලා අස්විය හැකි ය.

(4) කලින් අවසර ලබා නොගෙන මණ්ඩලයේ අනුගාමී රැස්වීම් තුනකට පැමිණීමට අපොහොසත් වන පත්කරනු ලැබූ යම් සාමාජිකයකු මණ්ඩලයේ සාමාජිකයකු වශයෙන් වූ තම ධූරය අත්හැර ගිය ලෙස සලකනු ලැබිය යුතු අතර, ඒ හේතුවෙන් ඇතිවන පුරප්පාඩුව පිරවීම පිණිස කොමිෂන් සභාව විසින්, 6 වන ඡේදයේ විධිවිධාන සැලකිල්ලට ගනිමින්, සුදුසු තැනැත්තකු පත් කරනු ලැබිය යුතු ය.

(5) මණ්ඩලයේ රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූරණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු ය.

(6) එක් එක් වර්ෂයේ දී අවස්ථා හතරකට නොඅඩු වන පරිදි අවශ්‍ය කවර අවස්ථාවක වුව ද, මණ්ඩලය රැස්විය යුතු ය.

(7) රැස්වීමක් කැඳවීම අවශ්‍ය යයි තමා සලකන කවර අවස්ථාවක දී හෝ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් එකකට නොඅඩු සංඛ්‍යාවකගෙන් ඒ සඳහා ලිඛිත ඉල්ලීමක් ලැබී දින දහ හතරක් ඇතුළත දී හෝ අධ්‍යක්ෂවරයා විසින් මණ්ඩලයේ විශේෂ රැස්වීමක් කැඳවනු ලැබිය යුතු ය.

8. (1) පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, ආයතන වෙත මෙම නියමාවලියෙන් පැවරෙන නැතහොත් නියම කෙරෙන බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු ය.

(2) පනතේ හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට හා සනාතන සභාවේ බලතලවලට හා කාර්යවලට සහ අධ්‍යයන සභාවල යම් උපදෙසකට හෝ තීරණයකට යටත් ව, ආයතනය විසින් සලසනු ලබන අධ්‍යාපනය, පර්යේෂණ, හා වෙනත් පුහුණු වැඩසටහන් සහ පවත්වනු ලබන විභාග පිළිබඳ පාලනය හා සාමාන්‍ය විධානය මණ්ඩලය සතු වන්නේ ය.

(3) (1) වන සහ (2) වන අනුඡේදවලින් මණ්ඩලය වෙත පවරනු ලැබූ බලතලවල ව්‍යාප්තියට අගතියක් නොමැතිව, පහත සඳහන් බලතල, කාර්ය හා කර්තව්‍ය මණ්ඩලය විසින් ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කරනු ලැබිය යුතු යː-

(අ) ආයතනයේ දේපළ සහ අරමුදල් දැරීම, පාලනය කිරීම සහ පරිපාලනය කිරීම;

(ආ) ආයතනයට සම්බන්ධ සියලු කාරණා නියමාවලියෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව විධිමත් කිරීම හා නිශ්චය කිරීම;

(ඇ) නිශ්චිත කාර්යයන් සඳහා ආයතනයට සුදුස්සක් කර ගැනීමට සපයන ලද යම් අරමුදල් පරිපාලනය කිරීම;

(ඈ) බාහිර වශයෙන් හෝ කොන්ත්‍රාත්තු පදනමක් මත හෝ ශාස්ත්‍රීය, පුහුණු කිරීම්, පර්යේෂණ, අධීක්ෂණ මට්ටමේ කාර්ය මණ්ඩලය බඳවා ගැනීම;

(ඉ) ආයතනය වෙත අන්තිම කැමති පත්‍ර මගින් කරනු ලබන පිරිනැමීම්, පරිත්‍යාග හා වෙනත් ප්‍රදාන, කොමිෂන් සභාවේ එකඟත්වය ඇතිව භාර ගැනීම හා පිළිගැනීම;

(ඊ) ආයතනයේ වාර්ෂික වාර්තාව හා ගිණුම් ප්‍රකාශය සලකා බැලීම හා නිර්දේශ කිරීම සහ ඒ වාර්තා සහ ප්‍රකාශ විශ්වවිද්‍යාලයේ පාලක සභාව සහ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(උ) ආයතනයේ මුදල් ඇස්තමේන්තු පිළියෙල කිරීම හා ඒ ඇස්තමේන්තු විශ්වවිද්‍යාලය හා කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඌ) කළමනාකරණ හා පරිපාලන අධ්‍යයනයෙහි විවිධ ක්ෂේත්‍රවල ප්‍රදානය කළ යුතු පශ්චාත් උපාධි, පශ්චාත් උපාධි අභිඥාන පත්‍ර, සහතික පත්‍ර සහ ශාස්ත්‍රීය විශිෂ්ටතා පිළිබඳවත්, හැදෑරිය යුතු අධ්‍යයන පාඨමාලා සහ ලැබිය යුතු පුහුණුව පිළිබඳවත්, සාමාර්ථ ලැබිය යුතු විභාග පිළිබඳවත්, එවැනි උපාධි, අභිඥාන පත්‍ර, සහතික සහ ශාස්ත්‍රීය විශිෂ්ටතාවලට සුදුස්සන් වීමේ අභිලාෂය ඇති ශිෂ්‍යයන් විසින් සපුරාලිය යුතු වෙනත් කොන්දේසි පිළිබඳවත් අදාළ අධ්‍යයන සභාවෙහි හෝ සභාවල හෝ එකඟත්වය ඇතිව විශ්වවිද්‍යාලයට නිර්දේශ කිරීම;

(එ) අතුරු ව්‍යවස්ථා සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ යම් කාරණයක් සම්බන්ධයෙන් ද, ඒ කාරණය සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් කර, පාලක සභාව විසින් පැනවීම සඳහා ඉදිරිපත් කිරීම;

එසේ වුව ද, අදාළ අධ්‍යයන සභාවේ හෝ සභාවල හෝ වාර්තා සලකා බැලීමෙන් අනතුරුව මිස, අධ්‍යයන පාඨමාලා සහ විභාග සම්බන්ධයෙන් අතුරු ව්‍යවස්ථා කෙටුම්පත් නොකළ යුතු ය.

(ඒ) අදාළ අධ්‍යයන සභාවේ හෝ සභාවල වාර්තා සලකා බැලීමෙන් පසු අධ්‍යයන පාඨමාලාවට හා විභාගවලට අදාළ නියෝග කෙටුම්පත් කර, ඒ කෙටුම්පත් සනාතන සභාව වෙත ඉදිරිපත් කිරීම;

(ඔ) රීති සෑදීමට බලය දෙනු ලැබ ඇත්තේ හෝ රීති සෑදීම අවශ්‍ය වන්නේ යම් කාරණා සම්බන්ධයෙන් ද, ඒ කාරණා සම්බන්ධයෙන් රීති කෙටුම්පත් කර ඒ කෙටුම්පත් අවස්ථාවෝචිත පරිදි, පාලක සභාවට හෝ සනාතන සභාවට හෝ පැනවීම සඳහා ඉදිරිපත් කිරීම;

(ඕ) ආයතනයේ කටයුතු පවත්වා ගෙන යෑම සඳහා අවශ්‍ය ගොඩනැගිලි, පරිශ්‍ර, ගෘහ භාණ්ඩ, උපකරණ සහ වෙනත් ද්‍රව්‍ය සැපයීම හෝ සපයනු ලැබීමට සැලැස්වීම;

(ක) (i) ආයතනයේ කාර්ය සඳහා අවශ්‍ය විය හැකි පරිදි වූ මහාචාර්ය ධූර, සහාය මහාචාර්ය ධූර, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්ය ධූර, කථිකාචාර්ය ධූර හා වෙනත් තනතුරු ඇති කිරීම, නැති කිරීම හෝ අත්හිටුවීම සම්බන්ධයෙන්; සහ

(ii) ආයතනයේ ආචාර්යවරුන්, නිලධරයන් සහ වෙනත් සේවකයන් වශයෙන් පත් කරනු ලබන තැනැත්තන්ට තිබිය යුතු වන්නා වූ සුදුසුකම් සම්බන්ධයෙන් ද කොමිෂන් සභාවට නිර්දේශ කිරීම;

(ග) ආයතනයෙහි සේවයේ යෙදී සිටින තැනැත්තන් පත්කිරීමේ දී, සේවය අත්හිටුවීමේ දී, ඔවුන් සේවයෙන් ඉවත් කිරීමේ දී සහ ඔවුන්ගේ විනය පාලනය පිළිබඳව විශ්ව විද්‍යාලයට උපදෙස් දීම; සහ

(ච) සුදුසුයැයි සලකනු ලබන ස්ථාවර කමිටු හෝ තත්කාර්ය කමිටු සංඛ්‍යාවක් පත් කිරීම හා ඒවායේ නිර්ණේය විෂයයන් නියම කිරීම, ඒ කමිටුවල වාර්තා සලකා බැලීම හා වෙනස් කිරීම් ඇතිව හෝ නැතිව ඒ වාර්තා අනුමත කිරීම හෝ ඒ වාර්තා ප්‍රතික්ෂේප කිරීම;

(ජ) ප්‍රයෝජනයට නොයොදා ඇති යම් ආදායමක් ද ඇතුළුව ආයතනයට අයත් කවර මුදලක් වුව ද, භාර ආඥා පනතේ 20 වන වගන්තියේ හෝ වෙනත් ලිඛිත නීතියක හෝ විධිවිධාන යටතේ භාරකාර මුදල් ආයෝජනය කළ හැකි යම් සුරැකුම්පතක ආයෝජනය කිරීම; නැතහොත් කොමිෂන් සභාවේ අනුමතය ඇතිව ශ්‍රී ලංකාව තුළ නිශ්චල දේපළ මිලට ගැනීම සඳහා එවැනි යම් මුදලක් ආයෝජනය කිරීම හෝ එවැනි ආයෝජන වෙනස් කිරීම හෝ ඒ මුදල්වලින් වහාම අවශ්‍ය නොවන යම් කොටසක් කොමිෂන් සභාව විසින් අනුමත කරනු ලබන යම් බැංකුවක ස්ථිර තැන්පත් මුදලක් ලෙස තැන්පත් කිරීම

(ට) මේ නියමාවලියේ හෝ වෙනත් යම් උචිත සාධන පත්‍රයකින් විධිවිධාන සලසා ඇති පරිදි ආයතනයේ බලතලවලට ආනුෂංගික වන හෝ එහි ප්‍රතිඵලයක් ලෙස ආයතනයේ වෙනත් යම් බලතල ක්‍රියාත්මක කිරීම;

(4) අදාළ අධ්‍යයන සභාවේ මතය වාර්තා කිරීමේ හා මණ්ඩලය වෙත යැවීමේ අවස්ථාවක් ඒ අධ්‍යයන සභාවට දී ඇත්තේ නම් මිස, යම් අධ්‍යයන කාරණයක් සම්බන්ධයෙන් මණ්ඩලය විසින් කිසිම යෝජනාවක් සම්මත කර නොගත යුතු ය.:-

එසේ වුව ද, එසේ සම්මත කර ගත් කිසිම යෝජනාවක් විශ්වවිද්‍යාලයේ එකඟත්වය ඇතිව මිස, ක්‍රියාත්මක නොකළ යුතු ය.

9. පහත සඳහන් තැනැත්තන් ආයතනයේ නිලධරයෝ වන්නාහ:-

(අ) අධ්‍යක්ෂවරයා; සහ

(ආ) වෙනත් යම් තනතුරක් දරන තැනැත්තකු මේ ඡේදයෙහි කාර්යය සඳහා නිලධරයකු බව නියමාවලි මගින් ප්‍රකාශ කරනු ලැබ ඇත්තේ ද, එබඳු තනතුරක් දරන තැනැත්තා;

10. (1) මේ නියමාවලිය බලාත්මකභාවයට එළඹෙන විට ධූර දරන අධ්‍යක්ෂවරයා ඔහුගේ ධූර කාලය ඉකුත්වන තෙක් ඒ ධූරයේ අඛණ්ඩව කර්තව්‍යයන් ඉටුකළ යුතු ය. ඉන් පසුව සෑම අධ්‍යක්ෂවරයකු ම, මණ්ඩලය නිර්දේශ කරන නම් තුනකින් යුක්ත මූල මණ්ඩලයකින් කොමිෂන් සභාව විසින් පත් කරනු ලැබිය යුතු ය:

එසේ වුව ද, කිසිම තැනැත්තකු අනුක්‍රමික ධූර කාල දෙකකට වඩා අධ්‍යක්ෂවරයා ලෙස පත් කරනු නොලැබිය යුතු ය.

(2) උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයකු අධ්‍යක්ෂවරයා වශයෙන් පත් කරනු ලැබූ අවස්ථාවක, ඒ කාර්ය මණ්ඩලයේ එසේ පත් කරනු ලැබූ තැනැත්තා අධ්‍යක්ෂ ධූරය භාර ගැනීම සඳහා, ඒ ආයතනය හෝ විද්‍යායතනය විසින් මුදා හරිනු ලැබිය යුතු ය.

(3) අධ්‍යක්ෂවරයා කලින් ධූරය අත්හැර ගියහොත් මිස හෝ (4) වැනි අනුඡේදය යටතේ ධූරයෙන් ඉවත් කරනු ලැබුවහොත් මිස, පත් කරනු ලැබූ දින සිට ගණන් බලනු ලබන වර්ෂ තුනක කාලයක් ගතවීම හෝ ඔහුට හැටපස් වන විය සම්පූර්ණ වීම හෝ යන මේ අවස්ථා දෙකින් පළමුවෙන් එළඹෙන අවස්ථාව තෙක් ධූරය දරන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයකු දෝෂාරෝපණ යෝජනාවක් සම්මත කර ගැනීම සඳහා කැඳවනු ලැබූ මණ්ඩලයේ මුළු සාමාජික සංඛ්‍යාවෙන් තුනෙන් දෙකකට නොඅඩු ඡන්ද සංඛ්‍යාවකින් සම්මත කර ගනු ලැබූ දෝෂාරෝපණ යෝජනාවක් මත, කොමිෂන් සභාව විසින් ධූරයෙන් ඉවත් කරනු ලැබිය යුතු ය. එවැනි විශේෂ රැස්වීමක මුලසුන දැරීම සඳහා, සාමාජිකයන් විසින්, එම විශේෂ රැස්වීමට පැමිණ සිටින සාමාජිකයන් අතුරින් අධ්‍යක්ෂවරයා නොවන යම් සාමාජිකයකු තෝරා පත් කර ගනු ලැබිය යුතු ය.

(5) ධූරයෙන් ඉල්ලා අස්වෙන හෝ ඉවත් කරනු ලබන හෝ ස්වකීය ධූර කාලය අවසන් කරන අධ්‍යක්ෂවරයකු, අධ්‍යක්ෂවරයා වශයෙන් තමා පත් කරනු ලැබීමට පෙරාතුව ම, උසස් අධ්‍යාපන ආයතනයක හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයක කාර්ය මණ්ඩලයේ සාමාජිකයෙකුව සිටියේ නම් සහ ඔහු හැට පස් වන විය සම්පූර්ණ කොට නොමැති නම්, ඒ උසස් අධ්‍යාපන ආයතනයේ හෝ උසස් අධ්‍යාපන විද්‍යායතනයේ ඔහුගේ නිත්‍ය තනතුරට ඔහුට පෙරළා පැමිණිය හැකි ය.

(6) කලින් අවසර ලබා නොපැමිණීම, රෝගාතුර වීම, ශ්‍රී ලංකාවෙන් බැහැරව සිටීම හෝ වෙනයම් හේතුවක් නිසා තම ධූරයේ කාර්ය ඉටු කිරීමට අධ්‍යක්ෂවරයාට තාවකාලිකව නොහැකි වන අවස්ථාවක, එසේ කාර්ය ඉටු කිරීමට නොහැකි වී දින හතක් ඇතුළත අධ්‍යක්ෂවරයාගේ ධූරයේ කාර්ය ඉටු කිරීමට සුදුසු යැයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් සලකනු ලැබිය යුතු ය. එසේ වැඩ පිළිවෙළක් සලසන තෙක් විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ පීඨාධිපතිවරයා හෝ විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා, ඒ ධූරයේ එදිනෙදා කටයුතු කර ගෙන යා යුතු ය.

(7) අධ්‍යක්ෂ ධූරයේ යම් පුරප්පාඩුවක් ඇතිවන අවස්ථාවක ඒ පුරප්පාඩුව ඇති වී දින හතක් ඇතුළත (1) වන අනුඡේදය යටතේ ස්ථිර පත්වීමක් ලබනතුරු, ඒ ධූරයේ කටයුතු කර ගෙන යාමට සුදුසු යයි කොමිෂන් සභාව අදහස් කරන වැඩ පිළිවෙළක් කොමිෂන් සභාව විසින් යොදනු ලැබිය යුතු ය. එවැනි වැඩ පිළිවෙළක් යොදන තෙක් විශ්වවිද්‍යාලයේ ලේඛකාධිකාරීවරයා ඒ ධූරයේ එදිනෙදා කටයුතු කර ගෙන යා යුතු ය.

11. (1) අධ්‍යක්ෂවරයා, ආයතනයේ ප්‍රධාන විධායක නිලධරයා සහ ප්‍රධාන ශාස්ත්‍රීය නිලධරයා වන්නේ ය. ඔහු මණ්ඩලයේ සහ එක් එක් අධ්‍යයන සභාවක නිල බලයෙන් පත් වූ සාමාජිකයකු ද වන්නේ ය. ආයතනයේ වෙන යම් බල මණ්ඩලයක හෝ මණ්ඩලයක රැස්වීමක් කැඳවීමට, රැස්වීමකට පැමිණ සිටීමට හා එහිදි කථා කිරීමට ඔහුට හිමිකම් ඇති නමුදු ඔහු ඒ බල මණ්ඩලයේ හෝ මණ්ඩලයේ සාමාජිකයෙක් වන්නේ නම් මිස, එකී යම් රැස්වීමක දී ඡන්දය දීමට ඔහුට හිමිකම් නොමැත්තේ ය.

(2) මණ්ඩලය විසින් තත්කාර්ය සඳහා නීත්‍යානුකූලව වරින් වර තමා වෙත නිකුත් කරනු ලැබිය හැකි විධානවලට අනුකූලව, නියමාවලියේ, පනතෙහි හා වෙනත් යම් උචිත සාධන පත්‍රයක විධිවිධාන ආයතනයට අදාළ වනතාක් දුරට, ඒ විධිවිධාන යථා පරිදි පිළිපදින බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය. තව ද, ඒ කාර්යය සඳහා අවශ්‍ය යැයි ඔහු විසින් සලකනු ලබන සියලු බලතල ඔහුට ඇති අතර, ඒ බලතල ඔහු විසින් ක්‍රියාත්මක කරනු ලැබිය හැකි ය.

(3) මණ්ඩලයේ හා එක් එක් අධ්‍යයන සභාවක තීරණ ක්‍රියාත්මක කිරීම හෝ ක්‍රියාත්මක කෙරෙන බවට වගබලා ගැනීම අධ්‍යක්ෂවරයාගේ කාර්යය වන්නේ ය.

(4) අධ්‍යක්ෂවරයා ආයතනයේ ගණන් තැබීමේ නිලධරයා වන්නේ ය.

(5) ආයතනය තුළ විනය පවත්වා ගැනීම පිළිබඳව අධ්‍යක්ෂවරයා වගකිව යුතු ය.

12. කළමනාකරණ සහ පරිපාලන අධ්‍යයනයේ එක් එක් අධ්‍යයන ක්ෂේත්‍රය සම්බන්ධයෙන්, මණ්ඩලයේ නිර්දේශ මත කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද අධ්‍යයන සභා ආයතනය විසින් පිහිටුවනු ලැබිය යුතු ය.

13. (1) එක් එක් අධ්‍යයන සභාව පහත සඳහන් තැනැත්තන්ගෙන් සමන්විත විය යුතු ය.

(අ) අධ්‍යක්ෂවරයා; සහ

(ආ) විශ්වවිද්‍යාලයේ කළමනාකරණ අධ්‍යයන සහ වාණිජ විද්‍යා පීඨයේ හෝ මණ්ඩලය විසින් තීරණය කරනු ලබන වෙනත් විශ්වවිද්‍යාලයක හෝ උචිත වෘත්තීය මණ්ඩලයක, මහාචාර්යවරුන්, සහාය මහාචාර්යවරුන්, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරුන්, කථිකාචාර්යවරුන් යටත් පිරිසෙයින් තිදෙනෙකු ගෙන් යුක්ත විය යුතු පරිදි මණ්ඩලය විසින් පත් කරනු ලබන වෙනත් සාමාජිකයන් සය දෙනෙකු;

(2) යම් අධ්‍යයන සභාවකට, මණ්ඩලයේ එකඟත්වය ඇතිව නිශ්චිත කාර්යයක් සඳහා සහ නිශ්චිත කාල පරිච්ඡේදයකට එක් සාමාජිකයකු හෝ එක් සාමාජිකයකුට වැඩි සංඛ්‍යාවක් සහාය වීමට සම්බන්ධ කර ගත හැකි ය. එසේ සම්බන්ධ කර ගත් කිසිම සාමාජිකයකුට ඡන්දයෙන් පත්වීම සඳහා ඉදිරිපත් වීමට හෝ එම අධ්‍යයන සභාවේ රැස්වීමක දී ඡන්දය දීමට හෝ අයිතියක් නොමැති විය යුතු ය.

(3) යම් අධ්‍යයන සභාවකට පත් කරන ලද එක් එක් සාමාජිකයා සම්බන්ධයෙන් 7 වන ඡේදයේ (2) වන සහ (4) වන අනුඡේදවල විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව අදාළ විය යුතු ය.

(4) එක් එක් අධ්‍යයන සභාවකට ඒ අධ්‍යයන සභාවේ සාමාජිකයන් අතුරින් ඒ අධ්‍යයන සභාව විසින් තෝරා පත් කර ගනු ලබන සභාපතිවරයෙකු සිටිය යුතු ය.

(5) එක් එක් අධ්‍යයන සභාවක් සඳහා ඒ අධ්‍යයන සභාවේ සාමාජිකයන් අතුරින් අදාළ අධ්‍යයන සභාව විසින් තෝරාපත් කර ගනු ලබන ලේකම්වරයෙකු සිටිය යුතු ය.

(6) යම් අධ්‍යයන සභාවක රැස්වීමක් සඳහා අවශ්‍ය ගණපූර්ණය සාමාජිකයන් පස් දෙනෙකු විය යුතු අතර, සහාය වීමට සම්බන්ධ කර ගත් සාමාජිකයන් ඇත්නම්, ඔවුන් මේ කාර්යය සඳහා ඇතුළත් නොවිය යුතු ය.

14. නියමාවලියේ, පනතෙහි හා යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට යටත්ව, එක් එක් අධ්‍යයන සභාව විසින් පහත සඳහන් බලතල, කාර්යය හා කර්තව්‍ය ක්‍රියාත්මක කිරීම, කිරීම හා ඉටු කිරීම කළ යුතු ය.

(අ) මණ්ඩලය විසින් එම සභාව වෙත යොමුකරන ලද කවර කරුණක් හෝ පිළිබඳව සලකා බැලීමෙන් පසු වාර්තා කිරීම;

(ආ) මණ්ඩලයේ පාලනයට යටත්ව, ආයතනයේ ඉගැන්වීමේ වැඩ සටහන, විභාග හා පර්යේෂණ කටයුතුවලට සම්බන්ධිත වූ කාරණා සම්බන්ධයෙන් කටයුතු කිරීම; සහ

(ඇ) ආයතනයේ පවත්වනු ලබන අධ්‍යයන පාඨමාලා හා විභාගවලට සම්බන්ධිත වූ සියලු කාරණා සම්බන්ධයෙන් නිර්දේශ හා වාර්තා මණ්ඩලය වෙත ඉදිරිපත් කිරීම;

(ඈ) පරීක්ෂකවරයන් වශයෙන් පත් කිරීම සඳහා සුදුසු තැනැත්තන් මණ්ඩලයට නිර්දේශ කිරීම.

15. ආයතනයේ මුදල් වර්ෂය විශ්වවිද්‍යාලයේ මුදල් වර්ෂයම වන්නේ ය.

16. (1) (මෙහි මින් මතු "අරමුදල" යනුවෙන් සඳහන් කරනු ලබන) කළමනාකරණය පිළිබඳ පශ්චාත් උපාධි ආයතන අරමුදල යනුවෙන් හඳුන්වනු ලබන අරමුදලක් ආයතනයට තිබිය යුතු අතර, පහත සඳහන් මුදල් එයට ගෙවනු ලැබිය යුතු ය.

(අ) යම් උචිත සාධන පත්‍රයක විධිවිධානවලට අනුකූලව ආයතනයට ගෙවිය යුතු ගාස්තු;

(ආ) පරිත්‍යාගවලින් ලැබෙන ආදායම;

(ඇ) පාර්ලිමේන්තුව විසින් ප්‍රතිපාදන කරන ලදුව, කොමිෂන් සභාව විසින් ආයතනයට ආධාර මුදල් වශයෙන් වෙන් කරනු ලබන්නා වූ මුදල්;සහ

(ඈ) ආයතනයට අයිති වූ ද, කවර ප්‍රභවයකින් හෝ ලැබෙන්නා වූ ද වෙනත් සියලු මුදල්.

(2) මුදල් වර්ෂයේ එක් එක් කාර්තුව තුළ අරමුදලට ගෙවනු ලබන සියල මුදල් ප්‍රමාණ පිළිබඳව සාරාංශයක්, උචිත ආදායම් ශීර්ෂ යටතේ වර්ග කර, ඊළඟට එළඹෙන කාර්තුව අවසාන වීමට පෙර අධ්‍යක්ෂවරයා විසින් කොමිෂන් සභාව වෙත දැනගැනීම සඳහා ඉදිරිපත් කරනු ලැබිය යුතු ය.

17. (අ) නියමාවලිය මගින් පනවනු ලැබිය හැකි පිළිවෙළට හා ආකාරයට ආයතනයේ ගිණුම් තැබීම;

(ආ) අරමුදලට ගෙවනු ලබන සියලු මුදල් භාරගැනීම හා ඒ මුදල් නිසි ගිණුම් ශීර්ෂවලට බැර කිරීම;

(ඇ) බලය දෙනු ලැබූ සියලු ගෙවීම් කිරීම්; සහ

(ඈ) කොමිෂන් සභාවට අවශ්‍ය තෛවාර්ෂික ඇස්තමේන්තු සහ ඉදිරි මුදල් වර්ෂය සඳහා වාර්ෂික මුදල් විසර්ජන මණ්ඩලය සඳහා පිළියෙල කිරීම, අධ්‍යක්ෂවරයාගේ කාර්ය වන්නේ ය.

එසේ වුව ද, නිශ්චිත කාර්ය සඳහා කරනු ලබන ප්‍රදානවලින් හෝ නිශ්චිත අරමුණු සඳහා වූ පරිත්‍යාගවලින් ලැබෙන ආදායම් සම්බන්ධයෙන් වෙනම ගිණුම් ආයතනයේ ගිණුම්වල පෙන්නුම් කළ යුතු අතර, ආයතනයේ සාමාන්‍ය කාර්ය සඳහා හෝ ඒ ප්‍රදාන හෝ පරිත්‍යාග කරනු ලැබුවේ පිළිවෙළින් යම් කාර්ය හෝ අරමුණු සඳහා ද, ඒ කාර්ය හෝ අරමුණු නොවන කරුණු සඳහා හෝ ඒ ආදායමින් කිසිදු ගෙවීමක්, කොමිෂන් සභාවේ පූර්ව අනුමතය නොමැතිව කරනු නොලැබිය යුතු ය.

18. (1) කොමිෂන් සභාව විසින් කලින් නියම කරනු ලබන පිළිවෙළට හා ආකාරයට සහ එසේ නියම කරනු ලබන විස්තර ඇතුළත් කොට, සිය ආයතනයේ කටයුතුවලට අදාළ වාර්ෂික ගිණුම් හා සංඛ්‍යා ලේඛන පිළිබඳ ප්‍රකාශයක් ආයතනය විසින් පිළියෙල කරනු ලැබිය යුතු ය.

(2) ආයතනයේ ගිණුම් පොත් ආයතනයේ කාර්යාලයේ පවත්වාගෙන යා යුතු ය.

19. උසස් අධ්‍යාපන ආයතනයක ගිණුම් විගණනයට අදාළව පනතේ XIII වන කොටසේ සඳහන් විධිවිධාන අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ ගිණුම් විගණනයට සහ ඒ සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

20. (1) ආයතනයේ කාර්ය මණ්ඩලය, මණ්ඩලය විසින්, විශ්වවිද්‍යාලයේ එකඟතාවය සහ කොමිෂන් සභාවේ අනුමතය ඇතිව, ආයතනයේ බලතල, කාර්ය සහ කර්තව්‍ය කාර්යක්ෂමව ක්‍රියාත්මක කිරීම, කිරීම සහ ඉටු කිරීම සඳහා අවශ්‍ය යැයි මණ්ඩලය විසින් සලකනු ලබන නිලධරයන්, ආචාර්යවරයන් සහ වෙනත් සේවකයන්ගෙන් සමන්විත විය යුතු ය.

(2) විශ්වවිද්‍යාලය විසින් ස්වකීය කාර්ය මණ්ඩලයෙන් කරනු ලබන මුදා හැරීම් මගින් හෝ කොමිෂන් සභාව විසින් කරනු ලබන පත්වීම් මගින් ආයතනයකට කාර්ය මණ්ඩලය ලබා දිය යුතු ය. උසස් අධ්‍යාපන ආයතනයක කාර්ය මණ්ඩලය පත් කිරීමට අදාළ පනතේ X වන කොටසේ විධිවිධාන, අවශ්‍ය වෙනස් කිරීම් සහිතව ආයතනයේ කාර්ය මණ්ඩලයට කෙරෙන පත් කිරීම් කෙරෙහි හා පත් කිරීම් සම්බන්ධයෙන් අදාළ වන්නේ ය.

(3) විශ්වවිද්‍යාලයේ නිලධරයකු, ආචාර්යවරයකු හෝ වෙනත් සේවකයකු ආයතනයේ සේවය සඳහා පූර්ණ කාල පදනමක් මත මුදා හැර ඇති අවස්ථාවක, විශ්වවිද්‍යාලයේ ඔහුගේ නිත්‍ය තනතුරට හිමි වේතන හා දීමනා ආයතනය විසින් ඔහුට ගෙවනු ලැබිය යුතු ය. වෙනත් ඕනෑම අවස්ථාවක දී, විශ්වවිද්‍යාලය විමසීමෙන් පසු ආයතනය විසින් නිශ්චය කරනු ලබන වෙනත් දීමනා අදාළ නිලධරයාට, ආචාර්යවරයාට හෝ වෙනත් සේවකයකුට ගෙවනු ලැබිය හැකි ය.

(4) අධ්‍යක්ෂවරයාගේ විධානවලට හා විනය පාලනයට ආයතනයේ කාර්ය මණ්ඩලය යටත් විය යුතු ය.

21. ආයතනයේ යම් බල මණ්ඩලයකට හෝ වෙනත් මණ්ඩලයකට යම් තැනැත්තකු යථා පරිදි පත් කරනු ලැබුවේ ද, නම් කරනු ලැබුවේ ද, අතිරේකව යොදනු ලැබුවේ ද, නැතහොත් ඔහු ඒ බල මණ්ඩලයේ වෙනත් මණ්ඩලයක සාමාජිකයකුව සිටීමට හිමිකම් ලබා තිබේ ද, යන්න ගැන යම් ප්‍රශ්ණයක් පැන නැගුනහොත්, ඒ ප්‍රශ්නය කොමිෂන් සභාව වෙත යොමු කළ යුතු අතර, ඒ පිළිබඳ කොමිෂන් සභාවේ තීරණය අවසානාත්මක වන්නේ ය.

22. ආයතනයේ යම් බල මණ්ඩලයක හෝ වෙනත් මණ්ඩලයක කිසිම ක්‍රියාවක්, යෝජනා සම්මතයක් හෝ ක්‍රියා මාර්ගයක්, එහි සාමාජිකයන් අතර යම් පුරප්පාඩුවක් හෝ පුරප්පාඩු තිබීමේ හෝ එහි සාමාජිකයන් පත් කිරීමේ යම් දෝෂයක් තිබීමෙන් පමණක් අවලංගු නොවන්නේ ය.

23. මෙම නියමාවලියෙහි -
"පනත" යන්නෙන් 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත අදහස් වේ.

24. (1) 1985 දෙසැම්බර් මස 31 වැනි දින අංක 382/7 දරන ***අතිවිශෙෂ ගැසට් පත්‍රයේ*** පළ කරන ලද 1985 අංක 3 දරන නියමාවලිය සහ 1996 පෙබරවාරි මස 09 වැනි දින අංක 909/13 දරන ***අතිවිශෙෂ ගැසට් පත්‍රයේ*** පළ කරන ලද 1996 අංක 7 දරන නියමාවලිය, ඉහත කී නියමාවලිය යටතේ සිදු කරන ලද කිසිවකට අගතියක් නොමැතිව මෙයින් ඉවත් කරනු ලැබේ.

(2) මේ නියමාවලිය බලාත්මකභාවයට එළඹෙන දිනයට පෙරාතුව වූ දිනයේ දී, 1985 අංක 3 දරන නියමාවලියේ 16 වැනි වගන්තිය යටතේ පිහිටුවන ලද අරමුදලේ බැරට පවතින සියලු අරමුදල්, ඒ දිනයේ සිට බලාත්මක වන පරිදි මේ නියමාවලිය යටතේ ආයතනයේ අරමුදලේ බැරට පවතින අරමුදල් ලෙස අඛණ්ඩව පැවතිය යුතු ය.

09-209

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.